සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2025
ஆண்டிறுதி மதிப்பீடு - 2025
Year End Evaluation - 2025

11732

ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02

නම / பெயர் / Name ....................................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................................

**සැලකිය යුතුයි.**

**I කොටසේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

## I කොටස

- **ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ලෝකයේ වඩාත් උසින් ම පිහිටි සානුව කුමක් ද?
(1.) පාමීර් සානුව (2.) ටිබෙට් සානුව (3.) ඩෙකෑන් සානුව (4.) ඉරාන සානුව

02. පැසිපික් සාගරයට ගලා බස්නා ගංගාවක් වන්නේ,
(1.) මීකොං ගඟ (2.) ලීනා ගඟ (3.) අමූර් ගඟ (4.) ඉරවඩි ගඟ

03. ආසියා මහාද්වීපයට අයත් විලක් වන්නේ,
(1.) වික්ටෝරියා විල (2.) බයිකල් විල (3.) අයර් විල (4.) සුපීරියර් විල

04. ආසියාවේ නිවර්තන මෝසම් දේශගුණයට අයත් වන්නේ,
(1.) ජාවා දූපත් (2.) බංගලාදේශය (3.) ජපන් දූපත් (4.) මියන්මාරය

05. 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක දැකිය හැකි සංස්කෘතික ලක්ෂණයක් වන්නේ,
(1.) දිය ඇල්ල (2.) ගංගාව (3.) වාරි මාර්ග ඇළ (4.) වනාන්තර

- **ප්‍රශ්න අංක 06 - 10 තෙක් ලබා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.**

06. ආසියාව හා අප්‍රිකාව එක්ව සලකා එය "යුරේසියාව" ලෙස හඳුන්වයි. (........)

07. මනස්ලු කඳු ශිඛරය හිමාලය කඳු පද්ධතියට අයත් ය. (........)

08. කාරිෆ් හා රාබි යනු පකිස්ථානයේ ප්‍රධාන වගා ඍතු දෙකයි. (........)

09. ශ්‍රී ලංකාවේ රාජාංගන වැව මල්වතු ඔය ආශ්‍රිතව පිහිටා ඇත. (........)

10. ශ්‍රී ලංකාවේ 2012 ජන සංගණන වාර්තාව අනුව සමස්ත ජන සංඛ්‍යාවේ ආයු අපේක්ෂාව 74.2% ක් වේ. (........)

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා දී ඇති ප්‍රශ්න වල 'අ' තීරුව හා 'ආ' තීරුව නිවැරදිව ගලපා නිවැරදි පිළිතුරට හිමි අක්ෂරය ඉදිරියෙන් ඇති තිත් ඉර මත යොදන්න.**

11.

| (අ) රටවල් | (ආ) ගඟ |
|---|---|
| (i) ඉන්දියාව | A - හොවැංහෝ |
| (ii) චීනය | B - අමූර් |
| (iii) මියන්මාරය | C - ගෝදාවරී |
| (iv) රුසියාව | D - සැල්වීන් |

(1.) ABDC (2.) DABC (3.) CADB (4.) CBDA (........)



For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

12. (අ) රටවල් — (ආ) අගනගර

(i) තායිලන්තය — A - බීජිං
(ii) ඉරානය — B - බැංකොක්
(iii) පිලිපීනය — C - ටෙහෙරාන්
(iv) චීනය — D - මැනිලා

(1.) BCDA (2.) DBAC (3.) ACBD (4.) CBDA (........)

13. (අ) වෙරළබඩ තැනිතලාවේ පිහිටි භූ ලක්‍ෂණ — (ආ) පිහිටි ප්‍රදේශ

(i) තුඩුව — A - නයිනතිව්
(ii) කලපු — B - රූමස්සල
(iii) වෙරළ දඹ — C - පුත්තලම
(iv) දූපත් — D - සංගමන්කන්ද

(1.) ACBD (2.) DCBA (3.) BACD (4.) ABDC (........)

14. (අ) භූ ලක්ෂණ — (ආ) පිහිටි ප්‍රදේශ

(i) හෙල් වැටි — A - නකල්ස්
(ii) ශේෂ කඳු — B - වැලිමඩ
(iii) සානු — C - බුලුතොට
iv) කඳු වැටි — D - රිටිගල

(1.) CDBA (2.) ADBC (3.) CBDA (4.) ABCD (........)

15. (අ) 1:50,000 සිතියම් වල සංස්කෘතික ලක්ෂණ — (ආ) සම්මත වර්ණ

(i) පරිපාලන මායිම් — A - කළු
(ii) දුම්රිය මාර්ග — B - රතු
(iii) වාරිමාර්ග ඇළ — C - කොළ
iv) වී වගාව — D - නිල්

(1.) BDCA (2.) DCBA (3.) BADC (4.) DBAC (........)

- **ප්‍රශ්න අංක 16 - 20 තෙක් සඳහන් වාක්‍යවල හිස්තැන් වරහන තුළින් තෝරා සම්පූර්ණ කරන්න.**

**(බියගම, පට්ටිපොළ, මිනුවන්ගොඩ, මහෝගනී, ස්පෘස්, මල්බෙරි)**

16. ශ්‍රී ලංකාවේ ................................................ ප්‍රදේශයේ කර්මාන්තපුරයක් පිහිටා ඇත.
17. ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය සිදු කරන ප්‍රදේශයක් ලෙස ................................................ වැදගත් වේ.
18. ................................................ ශාක විශේෂය කේතුධර වනාන්තරවල ව්‍යාප්තව ඇත.
19. ................................................ ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාපයක් පිහිටා ඇත.
20. සෞම්‍ය කලාපීය පතනශීලී වනාන්තර තුළ ................................................ ශාක විශේෂය දක්නට ලැබේ.

(ලකුණු 2 x 20 = 40)


For Educational Purpose Only
SLGURU.LK

## II කොටස


SLGURU.LK

සැලකිය යුතුයි.

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුයි.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

---

01. පහත දැක්වෙන ආසියා සිතියම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(1.) A, අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න. (ල. 2)

(2.) B අක්ෂරයෙන් දැක්වෙන සමුද්‍ර සන්ධිය කුමක් ද? (ල. 2)

(3.) C අක්ෂරයෙන් දැක්වෙන දූපත නම් කරන්න. (ල. 2)

(4.) D අක්ෂරයෙන් දැක්වෙන මුහුද කුමක් ද? (ල. 2)

(5.) E අක්ෂරයෙන් දැක්වෙන බොක්ක නම් කරන්න. (ල. 2)

(6.) F අක්ෂරයෙන් දැක්වෙන තැනිතලාව කුමක් ද? (ල. 2)

(7.) G අක්ෂරයෙන් දැක්වෙන කඳුවැටිය කුමක් ද? (ල. 2)

(8.) H අක්ෂරයෙන් දැක්වෙන සාගරය කුමක් ද? (ල. 2)

02. (i.) ආසියා මහාද්වීපයේ සාපේක්ෂ පිහිටීම අනුව උතුරින් පිහිටි සාගරය හා බටහිරින් පිහිටි මහාද්වීපය නම් කරන්න. (ල. 2)

(ii.) ආසියානු ප්‍රදේශයේ මානුෂ භූ දර්ශනයෙහි දැකිය හැකි ලක්ෂණ හතරක් ලියන්න. (ල. 4)

(iii.) (a) ආසියා ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන දේශගුණ වර්ග තුනෙන් දෙකක් නම් කරන්න. (ල. 2)

(b) ඔබ ඉහත සඳහන් කළ දේශගුණ වර්ගයක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)




For Educational Purpose Only

SLGURU.LK

03. (i.) පහත A හා B රූප දෙකෙහි දක්නට ලැබෙන මානව වර්ග දෙක නම් කරන්න. (ල. 2)



A



B

(ii.) (a) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය මුල්කරගත් ඉපැරණි නගර දෙක කුමක් ද? (ල. 2)

(b) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය ආශ්‍රිත ගංගා දෙක කුමක් ද? (ල. 2)

(iii.) ආසියාවේ අසම ජන ව්‍යාප්තිය කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

04. (i.) ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරය ආශ්‍රිතව පිහිටා ඇති ප්‍රධාන කඳු පන්ති දෙකක් නම් කරන්න. (ල. 2)

(ii.) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන කපොලු දෙකක් හා දියඇලි දෙකක් නම් කරන්න. (ල. 4)

(iii.) (a) කාලගුණය යනු කුමක් ද? (ල. 2)

(b) ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියට බලපාන සාධක දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 3)

05. (i.) ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය වනාන්තර පිහිටි ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(ii.) ශ්‍රී ලංකාවේ කඳුකර තෙත් කලාපීය වනාන්තරවල වැඩෙන වෘක්ෂලතාවල දැකිය හැකි ලක්ෂණ හතරක් ලියන්න. (ල. 4)

(iii.) (a) ශ්‍රී ලංකාවේ දක්නට ඇති ප්‍රධාන ජනාවාස වර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(b) ඉහත ඔබ සඳහන් කළ ජනාවාස වර්ගයක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)

06. (i.) ලෝකයේ රටවල් සංවර්ධනය දැක්වීමට යොදා ගන්නා දර්ශක දෙකක් නම් කරන්න. (ල. 2)

(ii.) පාරිසරික අසංතුලනයට බලපාන හේතු හතරක් ලියන්න. (ල. 4)

(iii.) (a) පාරිසරික සමතුලිතතාව රැක ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න. (ල. 2)

(b) තිරසර සංවර්ධනය යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 3)

07. (i.) 1:50,000 භූ ලක්ෂණ සිතියමක දක්නට ලැබෙන වෙරළාශ්‍රිත භූ ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 2)

(ii.) පහත දැක්වෙන සංස්කෘතික ලක්ෂණ සම්මත සංකේත හා වර්ණ භාවිතයෙන් ඇඳ දක්වන්න.

a) අධිවේගී මාර්ගය
b) දිස්ත්‍රික්ක මායිම
c) උසාවිය
d) ගෙවත්ත (ල. 4)

(ii.) ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර සබඳතාවයක් පවතී. මෙම සම්බන්ධතාවය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 5)



SLGURU.LK
For Educational Purpose Only
SLGURU.LK